කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංගකලාව (නව/පැරණි නිර්දේශය)

අපරදිග නාට්‍ය හා රංග කලාව **DMAT – 2015**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය කෙරේ බලපෑ සමාජ, සංස්කෘතික සහ දේශපාලනික සාධක මොනවාදැයි පෙන්වා දෙන්න.

නැතහොත්

ග්‍රීක රඟමඩලේ සැලැස්ම සහ අංගෝපාංග මොනවාදැයි පෙන්වා දී, රඟ දැක්වීමේ ශෛලිය කෙරෙහි එමගින් සිදු වූ බලපෑම විවරණය කරන්න.

02. කාව්‍යශාස්ත්‍රය කෘතියේ දැක්වෙන ට්‍රැජඩි නාට්‍යයක අඩංගු විය යුතු සඩාංග සොෆොක්ලීස්ගේ නාට්‍ය කෘති උදාහරණ වශයෙන් ගෙන විග්‍රහ කරන්න.

03. ඊස්කිලස්ගේ ඔරෙස්ට්‍රියා නාට්‍ය ත්‍රිකය *(The Oresteia)* උදාහරණ වශයෙන් ගෙන, ඔහුගේ දෘෂ්ටිය විවරණය කරන්න.

නැතහොත්

යුරිපිඩිස්ගේ මීඩියා *(Medea)* හෝ ට්‍රෝජන් කාන්තාවෝ *(The Trojan Women)* නාට්‍ය උදාහරණ වශයෙන් ගෙන, ඔහුගේ දෘෂ්ටිය විවරණය කරන්න.

04. ග්‍රීක කොමඩි (comedy) නාට්‍යයේ හෝ රෝම ප්‍රහසන (farce) නාට්‍යයේ ලක්ෂණ අදාළ නාට්‍යකරුවන්ගේ කෘති උදාහරණ වශයෙන් ගෙන පෙන්වා දෙන්න.

## II කොටස

05. මධ්‍යතන යුගයේ නාට්‍ය කලාව ප්‍රභවය වීමට හේතු වූ ලක්ෂණ පෙන්වා දෙමින්, මිස්ටරි *(Mystery Plays)* , මිරැකල් *(Miracle Plays)* හා මොරැලිටි *(Morality plays)* යන නාට්‍යවල ඇති සුවිශේෂී ලක්ෂණ සමාලෝචනය කරන්න.

නැතහොත්

සකලජන *(Everyman)* නාට්‍යයේ තේමා භාවිතය උදාහරණ සහිත ව විවරණය කරන්න.

06. බෙන් ජොන්සන් හෝ ක්‍රිස්ටෝපර් මාලෝ හෝ තෝමස් කිඩ් යන නාට්‍යකරුවන් අතරින් එක් නාට්‍යකරුවෙකු තෝරාගෙන, ඔහුගේ රචනා ශෛලියේ ඇති සුවිශේෂී ලක්ෂණ උදාහරණ සහිත ව පෙන්වා දෙන්න.

07. "ෂේක්ස්පියර්ගේ ට්‍රැජඩි නාට්‍ය මගින් නිරූපණය වන්නේ පෘතග්ජන මිනිසා තුළ ඇති බලය පිළිබඳ ආශාවය." මෙම මතය සනාථ කරන්න.

08. ප්‍රංශ නව සම්භාව්‍යවාදී නාට්‍යකරුවන් කවුරුන්දැයි හඳුන්වා දී, එම නාට්‍ය සම්ප්‍රදායේ ඇති සුවිශේෂී ලක්ෂණ උදාහරණ සහිතව විවරණය කරන්න.

***********************************